PAFFREL
නිදහස් හා සාධාරණ මැතිවරණයන් සඳහා ජනතා ක්‍රියාකාරීත්වය.
சுதந்திரமானதும் நியாயமானதுமான தேர்தல்களுக்கான மக்கள் செயற்பாடு.
PEOPLE'S ACTION FOR FREE & FAIR ELECTIONS

2024 සැප්තැම්බර් 21

**මැතිවරණ දින වාර්තාව**

මෙවර ජනාධිපතිවරණය අද (සැප්තැම්බර් 21 2024) වන දින පැවැත්වින. ලියාපදිංචි ඡන්දදායකයන් 17,140,354 ක්, දිවයින පුරා ඡන්ද මධ්‍යස්ථාන 13421 කදී, තමන්ගේ ඡන්දය භාවිත කරන්නට සුදුසුකම් ලබා සිටියහ. 1982 වසරේදී පැවැත්වූ ප්‍රථම ජනාධිපතිවරණයේ සිට මේ දක්වා වාර්තාගත ඉහළම ජනාධිපති අපේක්ෂකයන් සංඛ්‍යාවක් වන අපේක්ෂකයින් 39 දෙනෙකු මෙම ජනාධිපතිවරණයට ඉදිරිපත් විය. ඡන්දදායකයන් උද්‍යෝගිමත්ව මැතිවරණය ක්‍රියාවලියට සහභාගී වූ අතර, අද දින ඡන්ද විමසීම අවසන් වන විට දිවයින පුරා ආසන්න වශයෙන් 75% ත් සියයට 80% ත් අතර ප්‍රමාණයක් ඡන්දය ප්‍රකාශ කර ඇත.

ශ්‍රී ලංකා මැතිවරණ කොමිෂන් සභාවේ (ECSL) මග පෙන්වීමත්, මැතිවරණ නිරීක්ෂණ සංවිධාන ඇතුළු විවිධ පාර්ශවකරුවන්ගේ සහභාගිත්වයත් සමග 2024 ජනාධිපතිවරණයේ ඡන්ද ප්‍රකාශ කිරීම සාමකාමීව අවසන්වී ඇත. නිදහස් හා සාධාරණ මැතිවරණයක් පැවැත්වීමට, පූර්ව-මැතිවරණ කාලයේ සිට ඡන්ද දිනය දක්වා වැදගත් කාර්යභාරයක් මැතිවරණ කොමිෂන් සභාව ඉටුකරන ලදී.

අද දිනද මැතිවරණ ක්‍රියාවලිය පුරාවටම නීතිය හා සාමය ආරක්ෂා කිරීමට ශ්‍රී ලංකා පොලිසිය අදාල ආයතන සමග සහයෝගයෙන් කටයුතු කරන ලදී. පොලිස්පතිවරයෙකු (IGP) නොමැති, අවස්ථාවකදී පවා ශ්‍රී ලංකා පොලිසිය ඵලදායීව සහ අපක්ෂපාතීව කටයුතු කල අතර මෙවර ජනාධිපතිවරණය පැවැත්වීම සඳහා වන පසුබිම සකස් කිරීම, මැතිවරණ නීති උල්ලංඝනය වීම අවම කිරීම, ප්‍රචණ්ඩත්වය අවම කිරීම සහ පුරවැසියාගේ ඡන්ද අයිතිය ආරක්ෂා කිරීම සඳහා මැතිවරණ කොමිෂන් සභාව සහ ශ්‍රී ලංකා පොලීසිය ගත් උත්සාහයන් පැෆ්රල් සංවිධානය අගය කරයි.

මෙවර ජනාධිපතිවරණය සාමකාමීව අවසන් කරන්නට, ප්‍රජාතන්ත්‍රවාදයට සක්‍රීය නැඹුරුවක් ඇති ශ්‍රී ලංකා පුරවැසියන් විසින් දක්වන ලද දායකත්වය පිළිබඳව ප්‍රණාමය හිමිවිය යුතුමය.

5000 කට වැඩි මැතිවරණ නිරීක්ෂකයින්ගේ සක්‍රිය දායකත්වය සමගින්, සැලකිය යුතු ඡන්ද මධ්‍යස්ථාන සංඛ්‍යාවක් පැෆ්රල් සංවිධානය විසින් ආවරණය කරන ලදී. මැතිවරණ දිනය තුළ පැමිණිලි 164 ක් (තහවුරු කළ 109 ක් සහ තහවුරු නොකල 55ක්) පැෆ්රල් වෙත ලැබී ඇති අතර, මින් පැමිණිලි 161 ක් නීතිවිරෝධී මැතිවරණ ප්‍රචාරණ, ඡන්දදායකයින්ට බලපෑම් කිරීමට උත්සාහ කිරීම ඇතුළු මැතිවරණ නීති උල්ලංඝනය කිරීම් සම්බන්ධයෙන් වූ පැමිණිලි ලෙස දැක්විය හැකිය.

යටියන්තොට, දෙවිනුවර, අතුළුගොඩ, ගම්පහ, නාත්තන්ඩිය, කුලියාපිටිය, මාතර, වැලිගම, බෙන්තර-ඇල්පිටිය, බලංගොඩ, කොළොන්නාව, රත්ගම, කිරිබත්ගොඩ, මිනුවන්ගොඩ, කෝට්ටේ, රන්පොකුණගම (නිට්ටඹුව), සහ කෝන්ගහ මාවත (ගාල්ල) වැනි ප්‍රදේශවලින් මැතිවරණ නීති උල්ලංඝනය කිරීම් පිළිබඳ සිදුවීම් වාර්තා විය. නීති විරෝධී මැතිවරණ ප්‍රචාරණයේ සිට ඡන්දදායකයින් ප්‍රවාහනය කිරීම දක්වා මෙම වාර්තා වූ සිදුවීම් විහිදී යයි. නාඋල, මැද්දේකන්ද, බණ්ඩාරවෙල, බැරගම සහ මාවුස්සාව (පාත හේවාහැට) යන ප්‍රදේශවලින් බිය ගැන්වීම්, තර්ජන කිරීම් සහ පහරදීම් වැනි ප්‍රචණ්ඩ ක්‍රියා පහක් වාර්තා විය. ඡන්ද මධ්‍යස්ථාන ආශ්‍රිතව නීති විරෝධී මැතිවරණ ප්‍රචාරක කටයුතු, මහජන රැස්වීම්, බියගැන්වීම් සහ ඡන්දදායකයින්ට බලපෑම් කිරීම මෙන්ම ඡන්දදායකයින් ප්‍රවාහනය කිරීම වැනි බරපතල සිදුවීම් කිසිවක් වාර්තා වී නොමැත.

#No.16, Byrde Place, Off Pamankada Rd, Colombo 06.
Tel : (+94) 11 2558570 / 11 2558571 Fax : (+94) 11 2558572
Email : paffrel@sltnet.lk Web : www.paffrel.com

සමස්ථයක් ලෙස අප වෙත වාර්තා වූ සිද්ධි අතුරින් කිසිදු සිදුවීමක් ඡන්දය ප්‍රකාශ කිරීමට සැලකිය යුතු බලපෑමක් එල්ල කර නැත.

එනමුත් 2019 ජනාධිපතිවරණයට සාපේක්ෂව 2024 ජනාධිපතිවරණයේදී පූර්ව-මැතිවරණ සමයේ සිට ඡන්දය ප්‍රකාශ කරන දිනය දක්වා, රාජ්‍ය බලය, සම්පත්, සහ රාජ්‍ය සේවකයින් අයුතු ලෙස මැතිවරණ කටයුතු සඳහා යොදා ගැනීම පිළිබඳ සිද්ධීන් සහ පැමිණිලි සංඛ්‍යාව ඉහල ගොස් ඇත. රාජ්‍ය බලය යොදා ගනිමින් ඡන්දදායකයින්ට බලපෑම් කිරීම මෙන්ම, වත්මන් ජනාධිපතිවරයා අපේක්ෂකයෙකු වීම සහ ආණ්ඩු පක්ෂයේ දේශපාලඥයින් පවතින ආර්ථික අර්බුදය දඩමීමා කරගැනීම මෙයට හේතු විය.

පැෆ්රල් සංවිධානය විසින් මැතිවරණ දිනයේ නිරීක්ෂණ කටයුතු සඳහා යෙදවූ ජංගම, ස්ථානගත, සහ දිගුකාලීන නිරීක්ෂකයින් විසින් වාර්තා කර ඇති පරිදි, ඡන්ද මධ්‍යස්ථානවල අක්‍රමිකතා සිදුව ඇත්තේ ඉතා සුළු ප්‍රමාණයකි. ආබාධ සහිත පුද්ගලයන්ගේ ඡන්ද අයිතිය තහවරු කිරීමට මැතිවරණ කොමිෂන් සභාව ප්‍රමාණවත් පහසුකම් සහ උපමාන ඡන්ද මධ්‍යස්ථානවල සැකසුව ද, යම් ප්‍රදේශයන්හි ඡන්ද මධ්‍යාස්ථානවලට ප්‍රවේශවීමේ ගැටළු කිහිපයක් පැෆ්රල් නිරීක්ෂකයින් විසින් නිරීක්ෂණය කොට වාර්තා කරන ලදී. මේ සඳහා ද මැතිවරණ කොමිෂන් සභාව සාධනීය ඉදිරි ක්‍රියාමාර්ග ගන්නා බව පැෆ්රල් විශ්වාසයයි.

මැතිවරණය සඳහා ජාතිය, ආගම, වාර්ගිකත්වය පිළිබඳව ඡන්දදායකයින්ට ඒත්තු ගැන්වීමට සහ ඔවුන් හැසිරවීමට උත්සාහ කළ අවස්ථාවන් සහ ක්‍රියාවලීන් එතරම් සුවිශේෂී ලෙස පෙනෙන්නට නැත. ඩිජිටල් සහ සයිබර් පාදක ප්‍රචණ්ඩත්වය සහ මැතිවරණ නීති උල්ලංඝනය කිරීම් වාර්තා වුවද, අපේක්ෂකයින්, ඔවුන්ගේ මතවාද සහ ව්‍යාපාර කෙරෙහි වෛරී ප්‍රකාශ පෙර මැතිවරණවලට සාපේක්ෂව සැලකිය යුතු මට්ටමක නොතිබුණි.

මෙවර මැතිවරණ ප්‍රචාරණ ව්‍යාපාර සඳහා මෙන්ම, ඡන්දය පිළිබඳ පුරවැසියන්ගේ උත්ප්‍රේරණය කිරීමට සමාජ මාධ්‍ය හරහා වැඩි අවදානයක් යොමු කර ඇති බව පෙනෙන්ට තිබිණි. කෙසේ වෙතත් සමහර අපේක්ෂයින් පිළිබඳව පදනම් විරහිත චෝදනා ප්‍රචාරය කර ඡන්දදායකයන් අතර බිය පතුරුවන්නට ගත් උත්සාහයන් ද තිබුණි. පසුගිය මැතිවරණ වලට සාපේක්ෂව මෙම ජනාධිපතිවරණයේ සමාජ මාධ්‍ය භාවිතය ඉහළ ගොස් ඇත. මේ සම්බන්ධයෙන් මැතිවරණ කොමිෂන් සභාවේ අධීක්ෂණ කටයුතු තීරණාත්මක වන අතර, ඒ සඳහා අවශ්‍යය සහාය පැෆ්රල් සංවිධානය සහ හැශ්ටැග් පරපුර විසින් ඉදිරියට ලබා දීමට බලාපොරොත්තු වෙයි.

පැෆ්රල් සංවිධානයේ දිස්ත්‍රික් සම්බන්ධීකාරකවරුන් 40 ක්, ක්ෂේත්‍ර සම්බන්ධීකාරකවරුන් 25 ක්, ස්ථානගත නිරීක්ෂකයින් 3000 ක්, ජංගම නිරීක්ෂකයින් 728 ක්, දිගු කාලීන නිරීක්ෂකයින් 160 ක්, ප්‍රචාරණ වියදම් නිරීක්ෂකයින් 40 ක් සහ මැතිවරණ ආරවුල් නිරාකරණ මධ්‍යස්ථාන නිරීක්ෂකයින් 25 ක්, පූර්ව-මැතිවරණ සමයේ සිට මැතිවරණ දිනය දක්වා, මැතිවරණ නිරීක්ෂණ කටයුතු වල නියැලි සිටියහ. මැතිවරණවල ප්‍රජාතන්ත්‍රවාදී හරය තහවුරු කිරීම සඳහා පැෆ්රල් සංවිධානය අඛණ්ඩව මැදිහත්වීම් සිදුකරයි. අවසාන වශයෙන්, මැතිවරණයේ ප්‍රතිඵල ප්‍රකාශයට පත්කිරීම සහ පශ්චාත්-මැතිවරණ සමය තුළ සුපරීක්ෂාකාරීව සහ සන්සුන්ව සිටින ලෙස පැෆ්රල් සංවිධානය සියලුම පුරවැසියන්ගෙන්, දේශපාලන ක්‍රියාකාරීන්ගෙන් සහ බලධාරීන්ගෙන් ඉමහත් ඕනෑකමින් යුතුව ඉල්ලා සිටී.

රෝහණ හෙට්ටිආරච්චි

විධායක අධ්‍යක්ෂ